47590

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමග අමුණා භාර දෙන්න.

1. මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති. මෙවන් ස්වාමියෙකු ලද බිරිඳක් ද නිවීම ලැබ සිටින්නියකි." යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ,
   1. කිසාගෝතමියයි.
   2. මහා ප්‍රජාපතී ගෝතමියයි.
   3. යශෝදරා දේවියයි.
   4. විශාඛා දේවියයි.

2. සිදුහත් කුමරු අභිනිෂ්ක්‍රමණය කරන ලද්දේ,
   1. වෙසක් පුන් පොහෝ දිනක ය.
   2. ඇසළ පුන් පොහෝ දිනක ය.
   3. පොසොන් පුන් පොහෝ දිනක ය.
   4. දුරුතු පුන් පොහෝ දිනක ය.

3. දැනට ලොව පවතින පැරණිම පැවිදි සංවිධානය වන්නේ බෞද්ධ භික්ෂු සමාජයයි. එම සංවිධානයේ ප්‍රභවය සිදු වූයේ,
   1. වෙසක් පුර පසළොස්වක පොහෝ දිනක ය.
   2. පොසොන් පුර පසළොස්වක පොහෝ දිනක ය.
   3. වප් පුර පසළොස්වක පොහෝ දිනක ය.
   4. ඇසළ පුර පසළොස්වක පොහෝ දිනක ය.

4. බෞද්ධ දර්ශනයට අනුව යහපතට යෙදූ විට තම දෙමාපියන්ටත් වඩා යහපතක් සිදු කරන, නොමගට ගිය විට සතුරෙකුටත් වඩා අයහපතක් සිදු කරන බලවේගය වන්නේ,
   1. තමා කළ පාපයයි.
   2. තමා කළ කුසලයයි.
   3. තම සිතයි.
   4. තම ඥාතිවරයායි.

5. කෙනෙක් බුදුන් වහන්සේ, ධර්මය, සංඝයා, අතීතානාගත පැවැත්ම, කර්මය හා කර්ම ඵල, ශික්ෂා පද ආදිය පිළබඳව තම සිත තුළ සැකය උපදවා මෙලොව ද දුක් විඳ මරණින් පසුව ද අපායගතව දුකට පත් වෙති." මෙම ප්‍රකාශය ස්වාමීන් වහන්සේ නමකගේ ධර්ම දේශනාවකින් උපුටා ගන්නා ලද්දකි. එහි සඳහන් පුද්ගලයා දුකට පමුණුවන මනෝභාවය වන්නේ,
   1. කාමච්ඡන්දයයි.
   2. ව්‍යාපාදයයි.
   3. විචිකිච්ඡාවයි.
   4. ථිනමිද්ධයයි.

6. විසේසේන පස්සතීති විපස්සනා" යන පාලි පාඨයෙන් අර්ථකථනය කරනු ලබන්නේ,

1. සමථ භාවනාව පිළිබඳව ය.
2. ත්‍රිලක්ෂණ භාවනාව පිළිබඳව ය.
3. ධ්‍යාන භාවනාව පිළිබඳව ය.
4. සමාධි භාවනාව පිළිබඳව ය.

7. ඇස, කන, දිව, නාසය, ශරීරය, සිත යන ෂඩ් ඉන්ද්‍රියයන් මගින් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම යන අරමුණු ගැනීමත් සමග ම පහළ වන දැනීම,

1. විඤ්ඤාණ ස්කන්ධය යි.
2. රූප ස්කන්ධය යි.
3. වේදනා ස්කන්ධය යි.
4. සඤ්ඤා ස්කන්ධය යි.

8. සාරාර්ථ සංග්‍රහය" නම් කෘතිය රචනා කරන ලද්දේ,

1. අනගාරික ධර්මපාල තුමා ය.
2. රේරුකානේ චන්දවිමල මා හිමි ය.
3. වැලිවිට සිරි සරණංකර මාහිමි ය.
4. රීස් ඩේවිඩ්ස් පඬිතුමා ය.

9. තමා විසින් කරන ලද සියලු යහපත් ක්‍රියා සිය පින් පොතෙහි සටහන් කරන ලද්දේ,

1. දේවානම්පියතිස්ස මහ රජතුමා ය.
2. මහා පරාක්‍රමබාහු රජතුමා ය.
3. සිරිසඟබෝ මහ රජතුමා ය.
4. දුටුගැමුණු මහ රජතුමා ය.

10. එළඹසිටි සිහිය, යහපත් කල්පනාව, සතිය, හරි වැරදි දැන කටයුතු කිරීම, මතක ශක්තිය ආදිය පුද්ගලයාගේ යසස වැඩෙන කරුණුය. එම කරුණු සියල්ලම අර්ථවත් කිරීම සඳහා ධර්මයේ භාවිත කර ඇති පදය වන්නේ,

1. සතිමතෝ ය.
2. උට්ඨානවතෝ ය.
3. සුචිකම්ම ය.
4. සඤ්ඤතස්සච ය.

11. බුදුරදුන් ජීවමාන සමයේ වාසය කළ මහා ධන සිටු පුත්‍රයා උපයා ගත් සියලු ධනය අහිමි කොට ගෙන ඉණ ඇඳි වතට පමණක් සීමා වී දිළින්දෙකු බවට පත්වීම කෙරෙහි පාදක වූ ප්‍රධාන සාධකය වන්නේ,

1. පාපමිත්‍ර සේවනය යි.
2. මද්‍යසාර භාවිතයට හුරු වීම යි.
3. සීලයෙහි පිහිටා කටයුතු නොකිරීම යි.
4. අලසකමින් කල් ගෙවීම යි.

12. ගිහි විනය පැහැදිලි කෙරෙන සූත්‍ර ධර්මය වන්නේ,

1. මංගල සූත්‍රයයි.
2. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.
3. කරණීයමෙත්ත සූත්‍රයයි.
4. සිගාලෝවාද සූත්‍රයයි.

13. දෙමාපියන් විසින් මෛත්‍රී සහගතව, තම දරුවන්ගේ දුක් නිවමින්, දරුවන්ගේ දියුණුව දැක සතුටට පත් වෙමින්, දරුවන්ගේ සියලු සැප දුක් වේදනා උපේක්ෂා සහගතව ඉවසමින් තම දරුවෝ යහපතට යොදවනු ලබති. මෙහි සඳහන් දෙමාපියන් විසින් දරුවන් වෙනුවෙන් නොකරන කරුණක් වන්නේ,

1. මෙත්තා ය.
2. සීලය ය.
3. උපේක්ඛා ය.
4. කරුණා ය.

14. සිගාලෝවාද සූත්‍රයේදී සමස්ත සමාජය දලක් ආකාරයෙන් ගෙන ඔවුනොවුන් අතර අන්‍යෝන්‍යව ඉටුවිය යුතු යුතුකම් 61 ක් පැහැදිලි කර ඇත. එම කරුණු අතරින් පාරලෞකික ජීවිතය සඳහා සෘජුවම එල්ල කර ඇති කරුණ වන්නේ,
   1. සුගතියට මග පෙන්වීම යි.
   2. මව්පියන් පරලොව ගිය පසු පින් අනුමෝදන් කරවීම යි.
   3. මෛත්‍රී සහගත සිත් පහළ කර ගැනීම යි.
   4. නොඇසූ දේ කියා දීම යි.

15. අපි වෛර කරන්නවුන් අතර අවෛරීව සුවසේ වාසය කරමු." යන අර්ථය සඳහන් ධම්ම පද ගාථාවේ මුල් පද පේළිය වන්නේ,
   1. අක්කොච්ඡි මං අවධිමං..... යන්න යි.
   2. යෝචේ වස්සසතං ජීවේ...... යන්න යි.
   3. සුසුඛං වත ජීවාම....... යන්න යි.
   4. උට්ඨානවෙතෝ සතිමතෝ......... යන්න යි.

16. බෞද්ධ චින්තනයට අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය කරුණ වන්නේ,
   1. ආගමික සමගිය යනු සියලු ආගම් ඇදහීම යි.
   2. සෑම ආගමකින්ම උගන්වන්නේ එකම දෙයකි.
   3. බෞද්ධයා අන්‍යාගමික උත්සව තමන් විසින් පවත්වනු ලැබීම සහජීවනය යි.
   4. අන්‍යයන්ට තම ආගමික කටයුතු නිදහසේ කර ගැනීමට බාධා නොකර තම බොදු පිළිවෙත් මනාව පිළිපැදීම සහජීවනය යි.

17. අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය යනු,
   1. අකුසල මනෝ කම්ම වේ.
   2. කුසල මනෝ කම්ම වේ.
   3. කුසල වචී කම්ම වේ.
   4. අකුසල කාය කම්ම වේ.

18. ගරුක කුසල කර්මයකි,
   1. නියත මිථ්‍යාදෘෂ්ටිය.
   2. බුද්ධ ශරීරයේ ලේ සෙලවීම.
   3. පංච අභිඥා ලබා ගැනීම.
   4. මව මැරීම.

19. ගරුක, ආසන්න, ආචිණ්ණ කර්මවල බලපෑමක් නැති විටෙක විපාක ලබා දීමට ඉදිරිපත් වන්නේ,
   1. කටත්තා කර්මයි.
   2. ජනක කර්මයි.
   3. උපපීළක කර්මයි.
   4. උපඝාතක කර්මයි.

20. පංචස්කන්ධය උපමා වශයෙන් දක්වන තැනදී වේදනාව,
   1. පෙණ පිඬක් වැනි ය.
   2. මායාවක් වැනි ය.
   3. දිය බුබුලක් වැනි ය.
   4. කෙසෙල් කඳක් වැනි ය.

21. ජාති, ජරා, ව්‍යාධි, මරණාදී සාංසාරික දුක් හටගන්නා ආකාරය පැහැදිලි කරන්නේ,
   1. අනුලෝම පටිච්චසමුප්පාදයෙනි.
   2. පටිලෝම පටිච්චසමුප්පාදයෙනි.
   3. ත්‍රි ලක්ෂණ ධර්මයෙනි.
   4. දුක්ඛාර්ය සත්‍යයෙනි.

22. වෙනස්වීම නිසා ඇති වන දුක,
   1. සංඛාර දුක්ඛතා ය.
   2. විපරිණාම දුක්ඛතා ය.
   3. දුක්ඛ දුක්ඛතා ය.
   4. දුක්ඛාර්ය සත්‍ය ය.

23. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සමාධි ශික්ෂාවට අයත් නොවන අංගයක් වන්නේ,
   1. සම්මා ආජීව ය.
   2. සම්මා සති ය.
   3. සම්මා සමාධි ය.
   4. සම්මා වායාම ය.

24. බුදුරජාණන් වහන්සේ දේශනා කළ දුක්ඛ සමුදයාර්ය සත්‍යය,
   1. මැනවින් වටහා ගත යුත්තකි.
   2. ප්‍රහීණ කළ යුත්තකි.
   3. පුහුණු කළයුත්තකි.
   4. නිවන් අත්දකීමක් ලෙස පසක් කළ යුත්තකි.

25. සුජාතා සිටු දියණිය ගෞතම බෝසත් තාපසතුමන්ට කිරිපිඬු දානය පිරිනමන ලද්දේ,
   1. බෝධි පර්යංකයේදී ය.
   2. මුචලින්ද විල අසලදී ය.
   3. අජපල් නුගරුක මුලදී ය.
   4. කිරිපලු නුගරුක මුලදී ය.

26. බුදුරජාණන් වහන්සේ උතුම් බුදු බව ලබා දීමට උපකාරී වූ ඇසතු බෝධි වෘක්ෂයට කෘතවේදීත්වය දක්වීමෙන් ලොවට දුන් පණිවිඩය සඳහා වඩාත් සුදුසුම වරණය විය යුත්තේ,
   1. ලෝක සත්වයන්ට ගරු කළ යුතුය, යන්නයි.
   2. කළගුණ සැලකිය යුත්තේ මිනිසාට පමණක් බව, යන්නයි.
   3. කළගුණ සැලකිය යුත්තේ සත්වයින්ට පමණක් බව, යන්නයි.
   4. තමාට පිහිට වූ පරිසරයට ද ගරු කළ යුතුය, යන්නයි.

27. බුදුරජාණන් වහන්සේ චම්පා නුවර අසළ ගග්ගරා පොකුණ සමීපයේදී,
   1. සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කරන ලදී.
   2. සෝණදණ්ඩ සූත්‍රය දේශනා කරන ලදී.
   3. ධනිය ගෝපාල සූත්‍රය දේශනා කරන ලදී.
   4. කසීභාරද්වාජ සූත්‍රය දේශනා කරන ලදී.

28. ආනන්දයෙනි, මේ රජගහ නුවර සිත් අලවන සුළුය. එසේම නිග්‍රෝධය සිත්කලු ය. ඉසිගිලි පාර්ශ්වයේ කාලශිලාව ද සිත්කලුය......." යනු බුද්ධ ශ්‍රී මුඛයෙන් පිටවූ වදන්ය. එම වදන්වලින් ප්‍රකට කෙරෙන්නේ,
   1. බුදුරදුන් පරිසරයට ඇලුම් කළ බවයි.
   2. බුදුරදුන් පරිසරය සුරක්ෂිත කළ බවයි.
   3. බුදුරදුන් පරිසරයේ සොඳුරු බව ඇගයීමට ලක් කළ බව යි.
   4. බුදුරදුන් පරිසරය වර්ගීකරණයට ලක් කළ බව යි.

29. බුදුරජාණන් වහන්සේ විසින් ගිරිමානන්ද හිමිට දේශනා කළ කායික රෝග වැළඳීම සඳහා බලපාන කරුණු අටට අදාළ නොවන කරුණක් වන්නේ,

1. ශරීරගත පිත් ධාතුව කිපීමෙන් වැළඳෙන රෝගයි.
2. සෙම් ධාතුව කිපීමෙන් වැළඳෙන රෝගයි.
3. වාතය කිපීමෙන් වැළඳෙන රෝගයි.
4. රාග, ද්වේශ, මෝහ නිසා වැළඳෙන රෝගයි.

30. බුදුරජාණන් වහන්සේ වෛද්‍යවරයෙකු බව පෙළ දහම සඳහන් කරන්නේ,

1. මිනිස් සිත් තුළ ඇති රාගාදී උල් ඇද දැමීමට දහම් දෙසූ නිසා ය.
2. පූතිගත්තතිස්ස තෙරුන් උණු ජලයෙන් නහවා කායික නිරෝගිතාවය ඇති කළ නිසා ය.
3. කිසාගෝතමියගේ මළ පුතුට පණ දීමට අබ මිටක් ගෙන ඒමට කීම නිසා ය.
4. අංගුලිමාල නම් මානවකයා මනුෂ්‍ය ඝාතනයෙන් ගලවා ගත් නිසා ය.

31. ආගන්තුක, ආවාසික, ගමික, භත්තග්ග, වැසිකිළි ආදී වශයෙන් දැක්වෙන, භික්ෂූන් වහන්සේලාට අදාළ වත් මුළුමනින්ම පාහේ,

1. නිර්වාණාවබෝධයට උපකාරී වේ.
2. පරිසර සංරක්ෂණයට උපකාරී වේ.
3. භික්ෂූන් වහන්සේගේ ප්‍රසාදයට උපකාරී වේ.
4. භික්ෂූන් වහන්සේගේ විනයට උපකාරී වේ.

32. හැම කල්හිම මනා සිහියෙන් යුතුව පමණ දැන ආහාර ගන්නා මිනිසුන්ගේ දුක් වේදනාවන් තුනී වේ...... ඔවුන්ගේ ආයුෂය වැඩෙන්නේය." මෙම පුවත සඳහන් මූලාශ්‍රය වන්නේ,

1. ධම්ම පදය යි.
2. වනරෝප සූත්‍රය යි.
3. දෝණපාකසූත්‍රය යි.
4. අරුණවතී සූත්‍රය යි.

33. අනුභව කළ ආහාර වමාරා දමා නැවතත් ආහාර ගන්නා තරමට කෑමට ගිජු වූ තැනැත්තා ධර්මයේ දක්වා ඇත්තේ,

1. අලංසාටක නමිනි.
2. භුත්තවම්තක නමිනි.
3. කාකමාසක නමිනි.
4. ආහාර හත්ථක නමිනි.

34. භික්ෂූන් වහන්සේගේ ශිෂ්ටසම්පන්න හා සෞම්‍ය සම්පන්න පැවැත්ම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සිරිත් විරිත් හඳුන්වන්නේ,

1. සමාධි ශික්ෂාව නමිනි.
2. ප්‍රඥා ශික්ෂාව නමිනි.
3. සේඛියා ධර්ම නමිනි.
4. ගමිකවත් නමිනි.

35. පරිභෝජනවාදී සමාජයක් යනු,

1. ආහාර ඇතුළු භෞතික සම්පත් දියුණු කරන සමාජයයි.
2. ආහාර ඇතුළු භෞතික සම්පත් ඉතිරි කරන සමාජයයි.
3. ආහාර ඇතුළු භෞතික සම්පත් රැක ගැනීමට වෙර දරන සමාජයයි.
4. ආහාර ඇතුළු භෞතික සම්පත් පරිභෝජනය කිරීමට පමණක් මුල් තැන දෙන සමාජයයි.

36. මධ්‍ය ආසියාව හරහා පැවති තවලම් මාර්ගවල තැන තැන පිහිටි රාජ්‍යයන්හි මහායාන ධර්මය ප්‍රචාරය කරන ලද්දේ,

1. ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසිනි.
2. කණිෂ්ක ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසිනි.
3. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසිනි.
4. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසිනි.

37. ලංකාවේ ස්තූපයක ගර්භයේ සිට ඉහළින් ඇති අංග පිළිවෙළින් අන්තර්ගත වරණය වන්නේ,

1. හතරැස් කොටුව, දේවතා කොටුව, කොත් කැරැල්ල හා කොත ය.
2. දේවතා කොටුව, කොත් කැරැල්ල හා කොත ය.
3. කොත් කැරැල්ල, හතරැස් කොටුව හා දේවතා කොටුව ය.
4. හතරැස් කොටුව, කොත් කැරැල්ල, දේවතා කොටුව හා කොත ය.

38. හෙළ කලාකරුවා ස්තූප, බුදු පිළිම ආදී චිත්‍ර මූර්ති කැටයම් නිර්මාණය කරමින් බෞද්ධ ආකල්ප ජනිත කරවීමට ගෙන ඇති උත්සාහය උත්කෘෂ්ටය. එම නිර්මාණ නැරඹීමෙන් හුදී ජනයාගේ චිත්තාභ්‍යන්තරයෙන් ඉස්මතු වන්නේ,

1. එම නිර්මාණ ප්‍රතිසංස්කරණය කිරීමේ ආකල්පයයි.
2. එවැනි නිර්මාණ අන්තර්ජාලය මගින් ලොව ප්‍රකට කරලීමේ ආකල්පයයි.
3. කරුණාව, මෛත්‍රිය, ශ්‍රද්ධාව, ප්‍රඥාව වැනි සිතිවිලිවලින් හදවත් ප්‍රබුද්ධ වීමයි.
4. එවැනි නිර්මාණ නැවත නැවත නිර්මාණය කිරීමේ ආකල්පයයි.

39. දෙවන පැරකුම්බා නිරිඳුන් විසින් මේඝදූතය වැනි සංස්කෘතික මහා කාව්‍යයන්ගේ කාව්‍ය රීති ආභාසයෙන් ශෘංගාර රසය දනවන ලෙස රචනා කරන ලද සිංහල මහා කාව්‍යය ලෙස පිළිගැනෙන්නේ,

1. කව් සිළුමිණයි.
2. කාව්‍යශේඛරයයි.
3. මුවදෙව්දාවතයි.
4. අමාවතුරයි.

40. ශ්‍රද්ධාව පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කිරීම සඳහා ඉතා සුදුසුම වරණය විය යුත්තේ,

1. ශ්‍රද්ධාව යනු භක්තියයි.
2. ශ්‍රද්ධාව නිවන අවබෝධ කරයි.
3. ශ්‍රද්ධාව කෙලෙස් නැති කරයි.
4. ශ්‍රද්ධාව නිවන් මගට පිවිසීමේ දොරටුවයි.

60042

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

(i) පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. ලකුණු 20කි.

(ii) 02 සිට 07 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න හතරක් ද තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතුයි. එක් එක් ප්‍රශ්නයට ලකුණු 10ක් බැගින් හිමිවේ.

---

(01) (1) සතර බිය නම් කරන්න.

(2) "යේ ධම්මා හේතුප්පභවා...' යන ගාථාව සම්පූර්ණ කරන්න.

(3) කාම තණ්හාව යන්නෙහි අර්ථය ලියන්න.

(4) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථාන දෙකක් ලියන්න.

(5) බුදුරජාණන් වහන්සේ විසින් වදාළ රෝග දෙයාකාරය මොනවා ද?

(6) භික්ෂූන් වහන්සේලා විසින් ආහාර ගැනීමේ දී නොකළ යුතු දේවල් දෙකක් ලියන්න.

(7) ගර්භයේ ස්වරූපය අනුව ස්තූප වර්ග හයකි. ඉන් හතරක් නම් කරන්න.

(8) "පූජාවලිය" කෘතිය රචනා කිරීමේ දී වස්තු විෂය කරගෙන ඇති බුදු ගුණය හා එහි කතුවරයා ලියන්න.

(9) සතර සංග්‍රහ වස්තු පිළිවෙළින් නම් කරන්න.

(10) ආකාරවතී ශ්‍රද්ධාව යනු කුමක් ද? (2 × 10 = 20)

(02) (1) "ආරභථ නික්ඛමථ....." ගාථාව නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව සම්පූර්ණ කරන්න.

(2) ගෞතම බෝසත් දෙවියන් මනුලොව ඉපදීමේ අභියෝගය ජයගත් අයුරු කෙටියෙන් විස්තර කරන්න.

(3) ශිෂ්‍ය ජීවිතයේ මුහුණ දෙන ගැටලු තුනක් නම් කර, සිද්ධාර්ථ කුමාර චරිතයෙන් ආදර්ශ ගෙන ඒවා විසඳා ගත හැකි ආකාරය පෙන්වා දෙන්න. (2 + 3 + 5 = 10)

(03) (1) සිගාලෝවාද සූත්‍රානුගතව ගුරුවරුන් හා හිත මිතුරන් දක්වා ඇති දිශාවන් නම් කරන්න.

(2) මව්පියන් නැගෙනහිර දිශාවට උපමා කර ඇත්තේ කුමක් නිසා ද?

(3) බුදු දහමේ ඉගැන්වෙන යුතුකම් අන්‍යෝන්‍ය වශයෙන් ඉටුකරන සමාජයක සේව්‍ය-සේවක සබඳතා ශක්තිමත් වන ආකාරය පෙන්වා දෙන්න. (2 + 3 + 5 = 10)

(04) (1) "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි චේතයිත්වා කම්මං කරෝති, කායෙන වාචාය මනසා" යන්නෙහි අර්ථය ලියන්න.

(2) අකුසල මූල තුන නිවැරදිව ලියන්න.

(3) කර්ම සිදු කිරීම තුළින් ඔබගේ මෙලොව හා පරලොව ජීවිතය සුඛිත මුදිත වන ආකාරය පැහැදිලි කරන්න. (2 + 3 + 5 = 10)

(05) (1) අප අවට පරිසරයේ දක්නට ලැබෙන ප්‍රධාන අංශ දෙක ලියන්න.

(2) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය දම් සභා මණ්ඩප බවට පත්කර ගත් අවස්ථා 3ක් ලියන්න.

(3) බුදුරජාණන් වහන්සේ පරිසරයේ සොඳුරු බව අගය කළ අවස්ථා ‍ෙසකි. නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (2 + 3 + 5 = 10)

(06) (1) භික්ෂූන් වහන්සේ සම්බන්ධව දේශනා කර ඇති සිව්පසය ලියා දක්වන්න.

(2) ගිජු ලෙස ආහාර ගන්නා පුද්ගලයින් තිදෙනෙක් අර්ථ සහිතව දක්වන්න.

(3) ආහාර අනුභව කිරීමේ දී පුද්ගලයා විසින් අනුගමනය කළ යුතු සිරිත් විරිත් පෙන්වා දෙන්න. (2 + 3 + 5 = 10)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(1) අලුවිහාර ධර්ම සංගායනාව

(2) ශාරීරික චෛත්‍යය

(3) ඔබ කැමති සාහිත්‍ය කෘතිය

(4) සප්ත අපරිහානීය ධර්ම (5 + 5 = 10)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) 2 | (11) 4 | (21) 1 | (31) 4 |
| (2) 4 | (12) 3 | (22) 4 | (32) 4 |
| (3) 3 | (13) 1 | (23) 1 | (33) 3 |
| (4) 3 | (14) 3 | (24) 2 | (34) 2 |
| (5) 4 | (15) 4 | (25) 4 | (35) 2 |
| (6) 3 | (16) 3 | (26) 2 | (36) 4 |
| (7) 3 | (17) 2 | (27) 4 | (37) 2 |
| (8) 2 | (18) 4 | (28) 2 | (38) 1 |
| (9) 3 | (19) 3 | (29) 3 | (39) 4 |
| (10) 1 | (20) 2 | (30) 3 | (40) 1 |

Department of Education - Western Province

## II පත්‍රය

(01) (1) 1. උත්පත්තිය සඳහා පස්මහ බැලුම් බැලීමට සිදුවීම
2. ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමේ අභියෝගය
3. ඥාතීන් ඉදිරියේ ශිල්ප දක්වීමට සිදුවීම
4. තමාට සුදුසු කුල කුමරියක විවාහ කරගැනීමේ අභියෝගය
5. කාමභෝගී ජීවිතයක් ගතකිරීම
6. දුකින් මිදීමේ මාර්ගය සොයා යාම ආදී පිළිතුරු 2ක් (01 පාඩම)

(2) අරහං සම්මා සම්බුද්ධ විජ්ජාචරණ සම්පන්න ආදී නව අරහාදී බුදුගුණ 03 පාඩම - 14 පිටුව

(3) 1. සමථ භාවනාව
2. විපස්සනා භාවනාව

(4) 1. මත්පැන් පානය කිරීම
2. නුසුදුසු වේලාවන්වල සැරිසැරීම
3. නැටුම් ගැයුම් වැයුම්හි ලොල්වීම
4. සූදුවෙහි ලොල්වීම
5. පවිටු මිතුරන් ඇසුර
6. අලසකම 8 පාඩම - 46 පිටුව

(5) යටිගම් බලා යාම හැරපියා අඩුගම්බලා යාමට පෙළඹවීම 10 පාඩම - 59 පිටුව

(6) (1) කුසල කර්ම

(2) අකුසල කර්ම

(7) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන අංග තුනෙන් දෙකකි.

(8) කරුණු දැනීමෙන් / අවබෝධයෙන් යුතුව ඇති කරගන්නා වූ පැහැදීම

(9) අනුරාධපුර යුගයට

(10) කාම තණ්හා , භව තණ්හා , විභව තණ්හා (ලකුණු 2 × 10 = 20)

(02) (1) නොකළ යුතු දේ හෙවත් විරිත් 8 පාඩම - 45 පිටුව (ලකුණු 02)

(2) 1. මහත් වූ භෝග සම්පත් ඇත් කරගැනීම

2. කීර්තිය පැතිරීම

3. ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට ඇති හැකියාව ආදිය

8 පාඩම - 45 පිටුව (ලකුණු 03)

(3) 8 පාඩම ඇසුරෙන් සුදුසු ලකුණු ප්‍රදානය කරන්න. (ලකුණු 05)

(03) (1) මහණෙනි මම චේතනාවට කර්මය යැයි කියමි

සිතාමතා කරනු ලබන ක්‍රියා 12 පාඩම - 67 පිටුව (ලකුණු 02)

(2) 1. ආලෝභය

2. අද්වේශය

3. අමෝහය 12 පාඩම - 68 පිටුව (ලකුණු 03)

(3) 12 පාඩම - පිටුව බලන්න. (ලකුණු 05)

(04) (1) 1. ජීව පරිසරය

2. අජීව පරිසරය (ලකුණු 02)

(2) 1. ඉසිපතනයේ මිගදායේ දී පළමු දහම් දෙසුම පැවැත්වීම

2. සූකරකත ලෙනෙහි වේදනා පරිග්‍රහ සූත්‍රය දේශනා කිරීම

3. ඉච්ඡානංගල වනයෙහි දී අම්බට්ඨ සූත්‍රය දේශනා කිරීම

16 පාඩම - 90 පිටුව (ලකුණු 03)

(3) 16 පාඩම 91, 92, 93 පිටු බලන්න. (ලකුණු 05)

(05) (1) ථූපාරාම දාගැබ - දේවානම්පියතිස්ස රජතුමා (ලකුණු 02)

(2) ගණ්ඨාකාර ඝටාකාර ආදිය 20 පාඩම - 109 පිටුව (ලකුණු 03)

(3) 20 පාඩම - 113 පිටුව බලන්න. (ලකුණු 05)

(06) (1) උට්ඨානවතෝ සතිමතෝ

සුචිකම්මස්ස නිසම්මකාරිනෝ

සඤ්ඤතස්සච ධම්ම ජීවිනෝ

අප්පමත්තස්ස යසෝභී වඩ්ඪති 7 පාඩම - 43 පිටුව (ලකුණු 02)

(2) උත්සාහවන්ත වූ, මනා සිහිය ඇති, නිවැරදි දෙය පරීක්ෂාකාරීව කරන, හික්මීමෙන් යුත්, දැහැමිව ජීවත්වන තැනැත්තාගේ යසස වැඩෙන්නේ ය. 7 පාඩම - 43 පිටුව (ලකුණු 03)

(3) 7 පාඩම ඇසුරෙන් සුදුසු පිළිතුර ලියා ඇත්නම් අදාළ ලකුණු දෙන්න.

7 පාඩම - 43 /44 පිටු (ලකුණු 05)

(07) (1) 9 පාඩම , 51 පිටුව

(2) 18 පාඩම

(3) 22 පාඩම - 126 පිටුව

(4) 21 පාඩම - 120 , 121 , 122 පිටු (ලකුණු 2 × 5 = 10)

Department of Education – Western Province